ඔහු තවමත් තරුණයකි.

මේ කේමදාස මාස්ටර් ගැනෙයි

ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන් පසුගිය දිනවල බරපතල ලෙස අසනීප තත්වයෙන් පසුවිය. වතුකඩු බද්ධ කිරීමේ සැත්කමකින් අනතුරුව මේ වන විට සුවය ලබමින් සිටින ඔහු පිළිබඳව මේ ලිපියෙන් කතාබහ කෙරේ.

මාස්ටර් යනු ඉතාලි භාෂාවේ එම මව්ස්ලෝයන පදයෙන් බිඳී ආ පදයකි. එහි සේරුම නිපුණයා, හසලයා, ගාන්ධර්වයා යන්නයි. අද වන විට මාස්ටර් යන පදය සිංහල භාෂාවේත් තත්සම නාමයක් බවට පත්වෙමින් තිබේ. ඒ වෙනෙකක් නිසා නොව මාස්ටර් නිසාවෙනි. ලංකාවේ ද මාස්ටරිලා එමට සිටියත් සුප්‍රකට මාස්ටරිලා සිටින්නේ වක් අයෙකි. ඒ ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ය. කේමදාස, මාස්ටර් කෙනෙකු වූයේ අහම්බෙන් නොවේ. එය අතිශය දුෂ්කර ගමනක ප්‍රතිඵලයකි.

1937 ජනවාරි මස 25 වනදා පානදුර මහ රෝහලේ දී මෙලොව එළිය දුටු කේමදාස දරුවන් 13 දෙනෙකු සිටි පවුලේ බාලපිස්සා ය. කේමදාස ඉපදෙන්නටත් පෙර මේ පවුලේ සාමාජිකයන් අතරින් දෙදෙනෙකු ජීවිතයෙන් සමුගෙන තිබිණි. මේ නිසා කේමදාස සමඟ පවුලේ මුළු සාමාජිකයන් ගණන 11 කි. කේමදාස පවුලේ සෙසු සියලු සාමාජිකයන්ගේ නිහඬීව ගෙය වූයේ හැල්පිටියේ පිහිටි ඔවුන්ගේ නිවසයි. එහෙත් ගුරුවෙක් සිම්යොන් පෙරේරාවත්, ඇලන් හෝනා පෙරේරාවත් දාව උපන් කේමදාස ඉස්පිරිතාලයක උපන් පවුලේ පළමු සහ එකම දරුවා බවට පත්විය.

කුඩා කල පටන් ම පරිසර හිතකාමීයකු වූ කේමදාස, පියාගේ ජීවන වෘත්තිය වූ කිරි දෙවීමට දැඩි සේ අලුම් කළේ ය. කේමදාසගේ සෙහන්දිය වාරිකාවේ මංගල පිටවර ඇරැඹෙන්නේ මේ සමයේ දී ය. එළඳෙකුන් සමඟ කාලය ගත කරමින් සතා සිව්පාවන්ට ආදරය කරන්නට ඉගෙනගත් ඔහු අවව පරිසරයේ ඇති එමන්කාරය විඳින්නට නිරායාසයෙන් ම පුරුදු පුහුණු වූයේ ය.

අධ්‍යාපනය හැදෑරීම සඳහා පළමුවරට ඔහු පියනැඟුවේ හැල්පිටිය පිරිමි පාසලටයි. ඒ 1942 දී ය. වසර කිහිපයක් මේ පාසලේ හොඳින් ඉගෙනුම ලබමින් සිටින විට දිනක් මීතුරෙකු කේමදාසගේ හිතට අමුතු ම අදහසක් දැමීමේ ය.

''කේමා මේ ඉස්කෝලෙ වැඩක් නෑ. පානදුරේ සුමංගලේ නම් හොඳට උගන්වනවලු.''

''කොහොම ද ඒකට යන්නෙ...?''

''ඇතැළත් වෙන්න ඒකාගයක් තියෙනවා. ඒකෙන් පාස් වුණොත් යන්න පුළුවන්.''

මීතුරාගේ කිසි ඇසුං ඔහු දෙවතාවක් නොසිතා පානදුර සුමංගලයට යාමට තීරණය කළේ ය. ඔහු මේ බව ගෙදර ගොස් අම්මාට කීවේ ය.

''අම්මෙ මම යනව පානදුරේ සුමංගලේට.''

''ඇයි ඒ... මේ ඉස්කෝලේ හොඳ නැද්ද?''

''හොඳ නෑ. ඊට වඩා සුමංගලේ හොඳයිලු.''

''කොහොම ද ඒකට යන්නෙ. ඒකට හුඟක් දුර යන්න එපැයි''

''කමක් නෑ. මම පයින් යනවා.''

කේමදාස සෘජු තීරණ ගැනීමට කුඩා අවදියේ සිට ම හුරුවූ බැවින් දිනක් පයින් ම පානදුර සුමංගලයට ගියේ ය. මේ කුඩා දරුවා හැතැප්ම 1 1/2 ක් දුර පයින් ම පැමිණි බව දැනගත් සුමංගලයේ විදුහල්පති මවිත වීය. කෙසේ වුව ද විදුහලට ඇතැළත් වීමේ විභාගයට හෙමි සිටි කේමදාස ඉන් ඉහළින් ම සමත් වීය. මේ නිසා පානදුර සුමංගලය සඳහා කේමදාස හෝරාගන්නා ලදී.

පානදුර සුමංගලයේ සිරිතකින් ශිෂ්‍යයකු වන්නට ඔහුට වැඩිකලක් ගතවූයේ නැත. පස්වැනි පන්තියේ ඉගෙනුම ලබමින් සිටි සමයේ පැවති වර්ෂාවසාන විභාගයෙන් ඉහළින් සමත් වූ කේමදාසට එකවර පස්වැනි පන්තියේ සිට හත්වැන් පන්තිය දක්වා ඊළඟව උසස්වීමක් (දමමකැ ජටදපදවිතදබ) හිමිවීය. කේමදාස සමඟ තවත් සිසුන් 9 දෙනෙකුට මේ උසස්වීම හිමිවීය. මේ සිසුන් අතර කේමදාස සිටියේ දෙවැනි තැනට ය. එහෙත් විදුහල්පතිවරයා මේ සිසුන් දහ දෙනාගෙන් අදාළ උසස්වීම ලබාදුන්නේ සිසුන් දෙදෙනෙකුට පමණි.

විදුහල්පතිවරයා කළ මේ ක්‍රියාවෙන් තමන්ට බලවත් අසාධාරණයක් සිදුවූ බැවින් කේමදාස ඇතැළු සිසුන් අට දෙනා දැඩි ලෙස කලකිරීමටත් කෝපයටත් පත්වූහ.

''මේක හරි අසාධාරණයි. ඇයි ඒ දෙන්නා විතරක් ගන්නෙ. අපිත් විභාගෙන් පාස්වුණා. ඇයි අපිව ගන්නෙ නැත්තෙ. කේමා ඔයාට බැරිද ගිහිල්ලා ප්‍රින්සිපල්ගෙන් අහන්න?''

''හා මං අහන්නම්'' හොඬියව පිළිතුරු දුන් කේමදාස කෙලින් ම විදුහල්පතිවරයා හමුවීමට ගියේ ය.

''ඇයි මොක ද ඔය ළමයා?''

''ඇයි සර් අපිව පස්තියට ගන්නෙ නැත්තෙ?''

කේමදාසගේ පැමිණීමෙන් මවිත වූ විදුහල්පතිවරයා පසෙයට පිළිතුරු දීම පසෙකලා ඔහුට ආසා දිග හරන්නයි කීවේ ය. ඉඟින්කිති හොතැවිති පහර කීපයක් ගසා පිටත් කර යැවී ය. විදුහල්පතිවරයාගේ ක්‍රියාවන් සමඟ කේමදාසට අසාධ්‍යී තිබූ කලකිරීම තවත් තීව්‍ර වීය. එදින පාසල හමාරව ගෙදර යාම සඳහා පාරට බස්සඳ ඔහු පානදුර කඩවීදියේ දිගේ ඔබේ ඇවිදි ගියේ ය. මෙසේ ඇවිද යන අතර සිය කලකිරීම දුරුකර යනු පිණිස කුමක් හෝ කළ යුතු යැයි ඔහුට සිතිණි. පානදුර කඩවීදියෙන් ගය 75 ක් දී බටහලාවක් මිලදී ගැනීමට කේමදාස තීරණය කළේ ඒ නිසා ය. ඒ තීරණය ඔහුගේ දෛවයේ සැබැවින් ම ජේදනීය ලක්ෂයක් මි වූයේ ය.

මෙලෙසින් ගලා ආ කේමදාසගේ ජීවිත කතාව ඔහුගේ සංගීතය සේම එසසේ රසවත් ය. ඔහු සැමවිට ම එඩිතරව තීරණ ගන්නේ ය. සරල දෙය සරල ලෙසින් ද නිසරු දෙය නිසරු ලෙසින් ද දුටුවේ ය. පාසල් සමයේ සිදුවූ තවත් සිදුවීමකින් කේමදාසගේ මේ එඩිතර බව මනාවට ප්‍රතක්ෂ වේ.

එවකට ඔහු ඉගෙනුම ලබමින් සිටියේ ශාන්ත ජෝන් වීදානලයේ ය. මේ අවදිය වන විට කේමදාසට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ බටහලා වාදන ඉදිරිපත් කිරීමට ඉඩදිට අවස්ථාව ලැබිණි. දිනක් ගුවන් විදුලියේ පැවැත්වෙන වැඩසටහනක් සඳහා බටහලා වාදනය කිරීමට පැමිණෙන්නැයි කේමදාසට ආරාධනාවක් ලැබිණි. එහෙත් එම ආරාධනාවේ සඳහන් දිනය ඔහුට බරපතල ගැටලුවක් වීය. මක්නිසා ද යත් රජයේ ජෙෂ්ඨ විභාගයේ බුද්ධ ධර්මය විෂය සඳහා පෙනී සිටීය යුතු දිනය යෙදී තිබුණේ එදාට බැවිනි. දින ගණනාවක් ක්‍රප්තා කරමින් කුමක් කළ යුතුදැයි සිතූ කේමදාස අවසානයේ විභාගයට යාමට තීරණය කළේ ය. එහෙත් එදින ඔහුගේ මහසේ බටහලාව වාදනය සඳහා ගුවන් විදුලි සංස්ථාවෙන් එවා තිබූ ලිපිය ද තිබිණි.

''කේමා අද රෙඩියෝ එකට යන්නෙ නැද්ද?'' යාළුවෝ ප්‍රශ්න කළහ.

කිසිම පිළිතුරක් නොදුන් ඔහු කටපුරා සිනාසී විභාගයට වාඩිවූයේ ය. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රය අතට ලැබී විභාඩ කිහිපයක් ගත වූ නමුත් කේමදාස ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම ආරම්භ නොකළේ ය. තවත් විභාඩ කිහිපයක් ගතවීය. තවමත් පිළිතුරු ලිවීම ආරම්භ නොකළ ඔහු වටපිට බලමින් සිටියේ ය. විභාග හිරික්ෂණය සඳහා යොදවා සිටි ගුරුවරයා කේමදාස දෙස විපමමින් බලා සිටියේ ය. තවත් සුළු මොහොතක් ගතවීය. විභාග හිරික්ෂණය සඳහා යොදවා සිටි ගුරුවරයා සෙසු ළමයින් කුමක් කරන්නේ දැයි සොයා බැලීමට ඉදිරියට ගියේ ය. විගසින් ම ඇසුනේ මහා බටහලා නාදයකි. වහා කලබල වූ ගුරුවරයා හඬ ඇසෙන දෙසට දිව ගියේ ය. පිළිතුරු ලිවීම පසසකලා පැරණි ආනධමී ශයක් මිහිරි ලෙස වාදනය කරමින් සිටි කේමදාස, තමා දෙසට දිව එන ගුරුවරයා දැක බටහලාවත් ගුවන් විදුලියෙන් එවා තිබූ ලියුමත් රැගෙන ශාලාවෙන් එළියට දිව ගියේ ය. ඒ ඉවයාම හතර වූයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ය. එදා පටන් යළිත් කිසිසු ළිනෙක පාසලට නොගිය ඔහු සංගීතය සිය සුර්මා කාලීන වාත්තිය බවටත්, ඒකෝදාංශය බවටත්, ආත්මය බවටත්, පත්කර ගත්තේ ය.

කුඩා කාලයේ පටන් අනේක විදු දුක් විඳිමින් ඔහු ලද පන්තරය ඉතිහාසීති අපූරුව ලෙස සිය හිරිමාණවලට කැටි කළේ ය. ශ්‍රී ලංකිකයන්ට හුදු ආධුනික සංගීතයක් වූ ඔපෙරා, සිම්ෆනි, කැන්ටාරා අපේ හඬට මුසුකරමින් සහයදාය ඇතිමුවේ තැලු කේමදාස සංගීතය වනාහි මිහිසාගේ රිද්මය බව ඔප්පු

11 වන පිටට



සන්නස
වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

Asoka Subasinghe
Mobile 0425 720 932
TP 03 9796 4241

Denzil Jayaweera
Mobile: 0425 851 991
0401 714 408

Saliya Galappaththie
Mobile : 0422 671 826
TP 03 9310 4196
Fax 03 9310 5569